**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදල - 2019**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවල දී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ත්‍රෛමාසිකව අලුත් කිරීමේ පදනම මත 2015 සහ 2019 වර්ෂවලදී ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු එකතුව රු.මිලියන 27 ක මුදලකට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් එකඟ වෙමි. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට අවශ්‍ය කටයුතු කරමි. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව කටයුතු කිරීම. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 04 කට අදාලව 2019 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂ හා එදිනට ලෙජර් ගිණුම්වල පැවති ශේෂ අතර රු.9,690,015 ක නොසැසඳීම් නිරීක්ෂණය විය. | දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් එකඟ වෙමි. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට අවශ්‍ය කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශවල සඳහන් අගයන් හා ප්‍රභව ලියවිලිවල සඳහන් අගයන් එකිනෙකට සැසඳෙන ලෙස ගිණුම් පවත්වා ගැනීම. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිරි දීමනා අරමුදලේ පාලක මණ්ඩලය අරමුදල ආරම්භයේ සිට දීමනා ලබා ගෙන තිබුණ ද, ඒ සඳහා වූ නෛතික අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | දීමනා සඳහා පාලක මණ්ඩල අනුමැතිය මත ගෙවීම් සිදු කරයි. | පාලක මණ්ඩල සාමාජිකයින්ගේ පත්වීම් ලිපි විධිමත් පරිදි විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ** මු.රෙ. 387 | චෙක්පත් මගින් සිදු කරන සියලුම ගෙවීම් සඳහා පවතින බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරියා විසින් සෑහීමකට පත් විය යුතුයි. එසේවුවද, අරමුදල සඳහා වූ බැංකු ජංගම ගිණුමේ පවතින මුදල් ශේෂය ඉක්මවා චෙක්පත් ලිවීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.179,777ක බැර ශේෂයක් ගෙන තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ | **අංක PF/423 හා 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ** 03.2(ආ) ඡේදය | 2019 දෙසැම්බර් 31 දින එකතුව රු.38,335,003ක් වූ භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු වටිනාකම ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද ඉතුරුම් තැන්පතු ගිණුමේ මාසිකව රු.මිලියන 22ක සිට රු.මිලියන 58 දක්වා පරාසයක අතිරික්ත ශේෂයක් පැවතුණ ද, එම ශේෂය ද ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි. | අමාත්‍යවරයාගේ නියෝග අනුව සමස්ත අරමුදලින් සියයට 5ක් අරමුදලේ රඳවා තබාගත යුතු වේ. ඒවා තැන්පතු ගිණුමකට මාරු කර ආයෝජනය කරනු ලැබේ. | චක්‍රලේඛය පරිදි අතිරික්ත මුදලක් වේ නම් එය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා කටයුතු කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,082,958 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු3,269,741 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,813,217 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වාර්ෂික ආදායම රු. 11,352,744 කින් අඩු වී තිබුණ ද, ඊට වැඩි ප්‍රතිශතයකින් මෙහෙයුම් වියදම් රු.12,715,279 කින් අඩු වී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 අංක 04 දරන මෝටර් වාහන (ත්‍යාග දිරිදීමනා අරමුදල) නියෝග මාලාවේ 03 (1) නියෝගය පරිදි ත්‍යාග හා දිරිදීමනා සඳහා සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් 04ක් දක්වා තිබුණි. එහෙත් ත්‍යාග හා දිරිදීමනා ගෙවීම සඳහා වෙන් කල මුදලින් සියයට 08ක පරිපාලන වියදම් ගෙවීම හැරුණු කොට ඉතිරි සියයට 92 ම කාර්ය මණ්ඩලය අතර දිරිදීමනා ලෙස බෙදාහැර තිබුණි. එසේ වුවද පහත දැක්වෙන පරිදි ත්‍යාග ගෙවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වන්නේ නම්, සාවද්‍ය ලෙස සිදු කරන වාහන සකස් කිරීම්, වාහනවලට සිදුකරන වෙනස්කම් ආදී දෑ අනාවරණය කර ගැනීමේ හැකියාවක් පැවතුණු බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණ හා එකඟ වේ. | අරමුදලේ මූලික පරමාර්ථ පිළිබඳ වැඩි අවධානයක් යොමුකර කටයුතු කළ යුතු බව. |

(අ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව යම් මෝටර් රථයක් සකස් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, අළුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ, විකරණය කිරීමේ හා නිර්මාණය වෙනස් කිරීමේ නියුක්තව සිටින තැනැත්තන් පිළිබඳ තොරතුරු සපයන පාර්ශවයන් වෙත මුදල් ගෙවීම.

(ආ) ඇතැම් සාවද්‍ය ක්‍රියා හඳුනාගැනීම සඳහා තොරතුරු සපයනු ලබන හෝ එවැනි සාවද්‍ය ක්‍රියා අනාවරණය කර ගැනීමේ යෙදී සිටින තැනැත්තන්ට ත්‍යාග මුදල් ගෙවීම.

(ඇ) ප්‍රශංසාත්මක හෝ විශේෂ ඇගයීමක් අවශ්‍ය වන්නාවූ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා වර්ෂයකට රු.50,000ක් නොඉක්මවන පරිදි මුදල් ගෙවීම.

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිරිදීමනා ගෙවීම සඳහා අරමුදල් ගොඩනැගෙන මූලාශ්‍ර, මෝටර් වාහන පනතේ 213 ඇ (2) වගන්තියේ දක්වා තිබුණද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ තැන්පතු මත එකතු වූ පොලී මුදල් රු.7,272,842 ක් දිරි දීමනා ගෙවීම සඳහා උපයෝජනය කර තිබුණි. | 2019 වර්ෂයේ සිට දිරි දීමනා ගෙවීම තැන්පතු මත එකතු වූ පොලී උපයෝජනය කර නොමැත. | පවතින නීති, රීතිවලට අනුකූලව කටයුතු කිරීම. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැසුමක් පිළියෙල කර තිබුණි. එහෙත්, 2011 අංක 04 දරන මෝටර් වාහන (ත්‍යාග දිරි දීමනා අරමුදල) නියෝග මාලාව අනුව, මෝටර් වාහන ව්‍යාජ ලෙස නිපදවීම හෝ වෙනස් කිරීම ආදී දෑ පිළිබඳ තොරතුරු සපයන පාර්ශව වෙත මුදල් ත්‍යාග ගෙවීම් සම්බන්ධ සැලසුම් සකස් කර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. | අරමුණු මුදුන් පමුණුවා ගතහැකි වන පරිදි සැලැසුම් සකස් කිරීම කළයුතු වීම. |

**4.2** **අයවැය පාලනය**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)ඉකුත් වර්ෂ 02ක තථ්‍ය පරිපාලන වියදම් පිළිවෙලින් රු.447,000ක් හා රු.562,000ක් අතර පරාසයක පැවතියද, 2019 වර්ෂයේ පරිපාලන වියදම රු.1,157,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. මේ නිසා සිදුකර තිබුණු අධි වෙන් කිරීම ඇස්තමේන්තුගත වටිනාකමට සාපේක්ෂව සියයට 57 ක ප්‍රමාණාත්මක අගයක් ගෙන තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. | තාත්වික ලෙස අයවැය සංඛ්‍යා තීරණය කිරීම. |
| (ආ)ක්‍රීඩා හා ප්‍රශංසනීය ඇගයීම් සඳහා වාර්ෂික අයවැය ලේඛනය මගින් රු.100,000 ක වෙන් කිරීම් කර තිබුණ ද, එ වැනි වියදම් කිසිවක් වර්ෂය තුළ සිදුකර නොතිබුණු අතර දිරි දීමනා ලබා දීමේ මූලික අරමුණ වූ ත්‍යාග පිරිනැමීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. | තාත්වික ලෙස අයවැය සංඛ්‍යා තීරණය කිරීම. |
| (ඇ)නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ හැකි බැංකු තැන්පතු පොලී සහ ස්ථාවර තැන්පතු පොලී සඳහා පිළිවෙලින් සියයට 92ක් සහ සියයට 45ක් අඩුවෙන් ඇස්තමේන්තු සකස් කර තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. | තාත්වික ලෙස අයවැය සංඛ්‍යා තීරණය කිරීම. |